# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

**අභියාචනා අංක:- AAT/151/2022 (PSC)**

ආර්.එස්.රණසිංහ

**අභියාචක**

**එදිරිව,**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**වගඋත්තරකරු**

**දිනය : 2025.11.25**

| | | |
|---|---|---|
| **ඉදිරියේ දී** | **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි** | **(සභාපති)** |
| | **ජේ.ජේ.රත්නසිරි** | **(සාමාජික)** |
| | **එස්.නන්දසේකරන්** | **(සාමාජික)** |

පෙනී සිටීම :- අභියාචක සිටී.
අභියාචක වෙනුවෙන් රජයේ සේවක ඩී.ආර්.ඩී.යූ.දිසානායක මහතා.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් එම්.චන්ද්‍රිකා මලවිආරච්චි මහත්මිය.

**-<u>නියෝගය</u>-**

**විනිසුරු කේ.ටී. චිත්‍රසිරි මැතිතුමා**

ආර්.එස්.රණසිංහ නැමැති අභියාචක විසින්, 2022.12.11 දිනැතිව ඉදිරිපත් කරන ලද අභියාචනා පෙත්සම මඟින් ඉල්ලා ඇත්තේ, ඔහුව වැරදිකරු බවට පත් කර ඇති චෝදනා වලින් නිදහස් කර, ඔහු වෙත පනවා ඇති දඬුවම් සියල්ල ඉවත් කර දෙන ලෙසයි. අභියාචක වැරදිකරු බවට පත්කර ඇත්තේ, 2018.10.23 දිනැතිව ඔහු වෙත ඉදිරිපත් කරන ලද චෝදනා පහක් සම්බන්ධයෙනි. එකී චෝදනා පහට අදාළව පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ නිළධාරියා විසින් අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා පහටම ඔහුව වැරදිකරු බවට පත් කර ඇත. ඒ බව පරීක්ෂණය පැවැත්වූ එස්.ඩබ්.වඩනම්බි යන අය විසින්, 2019.11.20 දිනැතිව ඉදිරිපත් කරන ලද වාර්ථාව අවසානයේ සඳහන් කර ඇත. එම තීරණය පදනම් කර ගනිමින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අභියාචක වෙත, 2021.02.10 දිනැති විනය නියෝගය නිකුත් කර ඇත. එකී විනය නියෝගය මඟින් අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ

චෝදනා 5ටම ඔහුව වැරදිකරු බවට පත් කර ඇත. ඒ සඳහා දඬුවමක් ලෙස අභියාචකගේ වැටුප් වර්ධක තුනක් විලම්භනය කර, වැඩ තහනම්ව සිටි කාලයට අදාළව ඔහුට නොගෙවූ වැටුප් අහිමි කිරීමටද තීරණය කර ඇත.

එකී විනය නියෝගයට එරෙහිව අභියාචක විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත. එම අභියාචනය සළකා බැලූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව 2022.11.22 දිනැති ලිපිය මඟින් අභියාචක වෙත දන්වා ඇත්තේ, ඔහු විසින් ඉදිරිපත් කරන ලද අභියාචනය නිෂ්ප්‍රභ කිරීමට තීරණය කරන ලද බවයි. මේ අනුව පැහැදිලි වන්නේ, අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා පහටම ඔහුව වැරදිකරු බවට පත් කරමින්, ඒ අනුව නියම කරන ලද දඬුවම ඒ ආකාරයෙන් පවත්වාගෙන යාමට තීරණය වී ඇති බවයි.

එය එසේ වුවත්, 2023.02.20 දිනැති ලිපිය මඟින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කර ඇති නිරීක්ෂණ වාර්තාවේ අංක 04(IX) වන ඡේදයෙහි සඳහන් කර ඇත්තේ,

**"රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණය වන්නේ අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ II වන චෝදනාවට ඔහු නිවැරදිකරු''** වන බවටයි.

අභියාචක විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද අභියාචනය සළකා බැලූ අවස්ථාවේදී, මෙම කරුණු සළකා නොබැලීම කණගාටුවට කරුණකි. එයින් පෙනී යන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව කරුණු අධ්‍යනය කිරීමක් සිදු කර ඇත්තේ, මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරන ලද අභියාචනය සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමට සිදු වූ අවස්ථාවේදී බවයි.

කෙසේ වුවද, අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ I,III,IV,V චෝදනාවලට ඔහුව වරදකරු කරමින් දඬුවම් පමුණුවා තිබීමේ නිරවද්‍යතාවය මීළඟට සළකා බැලිය යුතුය. ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථ සාධක අංශයෙන් සෑම වර්ෂයක් ආරම්භයේදී එවනු ලබන ණය අංක ඇතුළත් ලේඛනයෙන්, 2014 වසරට අදාළව එවූ ලේඛනයේ පත්‍රිකා තුනක් අභියාචක විසින් ඉවත් කර තිබූ බවට සාක්ෂි ඉදිරිපත් වී ඇත.

අභියාචකට එරෙහිව නඟා තිබූ I වන චෝදනාව වන්නේ, 2017 ජුනි මස එක් දිනයකදී සේවක අර්ථසාධක අරමුදල් ඇපයට තබා ලබා දෙන නිවාස ණය නිකුත් කිරීමේ කටයුතු සිදු කිරීමේදී වංචා සහගතව රාජකාරී ලිපිලේඛන වෙනස් කිරීමට හෝ විකෘති කිරීමට හෝ විනාශ කිරීමට හෝ කූට ලේඛන සැකසීම යනාදී ක්‍රියාකාරකම් මඟින් අභියාචක වෙත පැවරී තිබූ රාජකාරී නිසි පරිදි ඉටු නොකර තිබීමයි. උපදෙස් උල්ලංඝනය කිරීම හා/හෝ නොසලකා හැරීම හා/හෝ මඟ හැරීම යන්න III වන චෝදනාවෙන් ඉදිරිපත් කර තිබූ කරුණයි. IV සහ V යන චෝදනා රඳා පවතින්නේ I සිට III දරන චෝදනා ඔප්පු කිරීම මතයි. මේ අනුව මෙහිදී සළකා බැලිය යුතු වන්නේ I සහ III චෝදනාවන් ඔප්පු කිරීම සඳහා පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත්ව තිබේද යන කරුණයි.

විධිමත් විනය පරීක්ෂණයේදී සාක්ෂිකරුවන් හතර දෙනෙකුගේ සාක්ෂි ඉදිරිපත් කර ඇත. ඩී.එම්.සෙනවිරත්න බණ්ඩා යන අය සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, අභියාචක සේවය කරන බටහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ ප්‍රධාන රාජ්‍ය කළමනාකාර සහකාර වශයෙන් ඔහු සේවය කළ බවයි. අනතුරුව, ඉහත කී ණය ඉල්ලුම්පත් සම්බන්ධයෙන් ඔහු විසින් ගතයුතු ක්‍රියාමාර්ග මොනවාද යන්න විස්තර කර ඇත. ඉන්පසු ඔහු ප්‍රකාශ කර ඇත්තේ, පරිගණක මුද්‍රිත ලේඛන එකින් එක ඒවායේ අනු අංක සමඟ පරීක්ෂා කිරීමේදී අංක 70,72,74 යන මුද්‍රිත පිටු, ගොනුවෙන් අතුරුදහන්ව ඇති බවයි. මේ සම්බන්ධයෙන් ඔහු විසින් අභියාචකගෙන් ප්‍රශ්න කරන ලදුව, අභියාචක ඔහු වෙත ප්‍රකාශ කර ඇත්තේ, කම්කරු නිළධාරී පනාගොඩ මහතා ළඟ මෙම කොළ තිබෙන බවයි. අනතුරුව අභියාචක ඉහත කී ඩී.එම්.සෙනවිරත්න බණ්ඩා යන අයට පවසා ඇත්තේ එම කොළ තුන පනාගොඩ මහතාගෙන් නැවත ලබාගෙන ඔහු වෙත භාර දීමට පොරොන්දු වූ බවට සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත.

මෙම සාක්ෂිය හරස් ප්‍රශ්න වලට භාජනය වූ බවක් නොපෙනේ. චූදිත හෝ සාක්ෂි දෙමින් මෙම තත්ත්වය සම්බන්ධයෙන් පැහැදිළි කිරීමක්වත් ඉදිරිපත් කර නැත. විධිමත් විනය පරීක්ෂණය අවසානයේදී අභියාචක සතු අයිතිවාසිකම්ක් වන, සාක්ෂි ඉදිරිපත් කිරීමේ අයිතිවාසිකම ඔහු වෙත පහදා දී තිබුණද, අභියාචක එම අවස්ථාවෙන් ප්‍රයෝජන ගෙන නැත. එයින් පෙනී යන්නේ ඉහත කී තත්ත්වය අභියාචක විසින්ම පිළිගෙන ඇති බවයි.

මෙහිදී වැදගත්ම සාක්ෂිකරු වන්නේ පී.බී.චන්දි ප්‍රේමචන්ද්‍ර යන අයයි. ඇය සහකාර කම්කරු කොමසාරිස්වරියක ලෙස මෙම සිද්ධිය වන අවස්ථාවේ බටහිර කොළඹ දිස්ත්‍රික් කාර්යාලයේ සේවය කර ඇත. ඇය සඳහන් කර ඇත්තේ විෂයගත ප්‍රශ්නයට අදාළ ලේඛන මහ බැංකුව වෙත ගෙන ගොස් භාරදෙනු ලබන්නේ කාර්යාලයේ කාර්යාල කාර්යය සහයක සේවකයෙක් විසින් බවයි. අභියාචක එම කාර්යයයේ නියැළුණු අයෙක් බවද සාක්ෂිවලින් හෙළිදරව් වේ.

තවත් වැදගත් සාක්ෂියක් හැටියට සැලකිය හැකි වන්නේ, 11(c) ලෙසට කර ඇති, අභියාචක විසින් මෙම සිද්ධිය සම්බන්ධයෙන් කර ඇති ප්‍රකාශයයි. එම ප්‍රකාශය අභියාචක විසින් ලබා දී ඇත්තේ, සාක්ෂිකරුවකු වන ජනක පරණමාන යන අය ඉදිරියේදීය. එම අය විධිමත් විනය පරීක්ෂණයේදී සාක්ෂි ඉදිරිපත් කර ඇත. සාක්ෂි ලෙස සළකුණු කර ඇති ඉහත කී11(c) ලේඛනය අවසානයේ, පරණමාන යන සාක්ෂිකරු ඔහුගේ අත් අකුරින් සඳහන් කර ඇත්තේ, එම ප්‍රකාශය ඔහු ඉදිරියේදී අභියාචක විසින් අත්සන් තබන ලද බවයි. ඒ අනුව මෙම ප්‍රකාශයේ සඳහන් කරුණු සාක්ෂියක් වශයෙන් ඇතුළත් කර ගත හැකි වනවා ඇත.

මෙම සාක්ෂි විනය පරීක්ෂණයකදී ඉදිරිපත්ව ඇති කරුණකට අදාළ වන නිසා, එය අපරාධ නඩුවකදී මෙන් විත්තිකරුවකුගේ ප්‍රකාශයක් ලෙස සලකමින්, ඒවා බැහැර කළ යුතු නොවේ. අභියාචක එම ප්‍රකාශය ලබා දීමේදී, ඔහුව බලකිරීමකට හෝ තර්ජනය කිරීමකට හෝ වෙනත් දිරිගැන්වීමකට හෝ යටත් වූ බවකටද සාක්ෂි ඉදිරිපත් නොවේ. විශේෂයෙන්ම මෙහිදී සඳහන් කළ යුතු වන්නේ අභියාචක එම ප්‍රකාශය ලබා දීමේදී, කිසියම් බලකිරීමකට හෝ තර්ජනය කිරීමකට හෝ වෙනත් ආකාරයකට  දිරිගැන්වීමකට යටත්වූයේ නම්, ඒ බව පැහැදිළි කිරීමට අභියාචකට ඕනෑ තරම් අවකාශ තිබුණු බවයි. අභියාචක කිසිඳු සාක්ෂියක් දීමට ඉදිරිපත්වී නැත. විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ නිළධාරියා විසින් විනය පරීක්ෂණය අවසානයේ සඳහන් කර ඇත්තේ,

**"විනිශ්චය සභාව නැවත විමසා සිටින්නේ විත්තිය වෙනුවෙන් සාක්ෂි කැඳවනවාද යන්නයි. ඊට පිළිතුරු ලබාදෙමින් රැකවරණ නිළධාරියා කියා සිටින්නේ විත්තිය වෙනුවෙන් සාක්ෂි කැඳවීමක් සිදු නොකරන බවයි."**

ඉහත කරුණු අනුව පැහැදිලිව පෙනී යන්නේ අභියාචක විසින් වරද පිළිගනිමින් කරන ලද ප්‍රකාශය සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරලීම සඳහා අවස්ථාව ලබා දී තිබුණද, එම අවස්ථාවෙන් අභියාචක ප්‍රයෝජනය ගෙන නොමැති බවයි. එයින් අදහස් වන්නේ අභියාචක ඔහු විසින් කරන ලද වරද පිළිගැනීම ඒ ආකාරයෙන්ම පිළිගෙන ඇති බවට සාක්ෂි ඉදිරිපත් වන බවයි.

මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතු වන්නේ සාක්ෂි ආඥා පනතේ, 112(F) වගන්තියේ සඳහන් පරිදි කිසියම් කරුණක් සම්බන්ධයෙන් විශේෂ දැනුමක් ඇති පුද්ගලයා විසින් ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් නොකරන්නේ නම්, එම සිද්ධිය ඒ ආකාරයෙන් සිදු වූ බවට පිළිගතහැකි බවට පූර්ව නිගමනය කළ හැකි බවයි.ඉහත කී කරුණුවලින් පැහැදිලිව පෙනී යන්නේ, අභියාචක විසින්ම ඔහු විසින් කරන ලද වරද පිළිගැනීමක් කර තිබෙන බවට පූර්ව නිගමනය කළ හැකි බවයි. අභියාචක එම පූර්ව නිගමනය බිඳ හෙළීමට කිසිඳු ප්‍රයත්නයක් ගෙන නොමැත.

මෙම කරුණු සහ ඉදිරිපත් වී ඇති අනෙකුත් සාක්ෂිද සලකා බැලීමෙන් අනතුරුව පෙනී යන්නේ, අභියාචක I,III,IV,V යන චෝදනාවලට වරදකරු බවට පත් කිරීමේ දෝෂයක් නොමැති බවයි. එම කරුණු සළකා බලා අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනය නිශ්ප්‍රභ කිරීමට තීරණය කරමු.

අභියාචනය නිශ්ප්‍රභා කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

**දෙව්මිනි/**